# පුංචි අන්දරේට පුංචි ආප්ප

අන්දරේ පුංචි කාලෙ උදේට ආප්ප කන්න ආසයි. ඉතින් අන්දරේගෙ අම්මා හැමදා ම උදේට අන්දරේට පනම් විස්සක් දෙනවා ආප්ප කන්න. ඒ පනම් විස්ස අන්දරේ අරගෙන ආප්ප අම්මා ළඟට ගිහින් ආප්ප හතරක් ගේනවා.

ආප්ප අම්මා උයන ආප්ප සමහර වෙලාවට පුංචියට හැදෙනවා. ඒ පුංචි ආප්ප විකිණෙන්නෙ නැතුව ඉතුරු වෙනවා. ඉතින්, ආප්ප අම්මා මොකද කරන්නෙ - මේ ඉතුරු වෙන පුංචි ආප්ප පුංචි අන්දරේට විකුණනවා. ආප්ප අම්මා කරන දේ පුංචි අන්දරේ ටික දවසක් හිත අමනාපෙන් බලන් හිටියා.



අන්තිමට එක දවසක් පුංචි අන්දරේ ඔහුට ම කියා ගත්තා, "හැමදා ම මට දෙන්නෙ පුංචි ආප්ප නේ. ආප්ප අම්මට මං හොඳ පාඩමක් උගන්වන්නම්කො," කියලා. ඉතින් එදත් ආප්ප අම්මා පුංචි අන්දරේ දුන්න පණම් විස්සට පුංචි ආප්ප හතරක් දුන්නා.

"ආප්ප අම්මෙ මොකද මේ ආප්ප මේ තරම් පුංචි?" කියලා අන්දරේ ඇහුවා.

එතකොට ආප්ප අම්මා කිව්වා, "අන්දරේ, උඹ පුංචියි නෙ. ඉතින් පුංචි අයට පුංචි ආප්ප කන්න ලේසියි. ඒ විතරක් ද, පුංචි ආප්ප බර අඩු හින්දා ගෙනියන්නත් ලේසියි."

"ආ, හැබෑද?" කියන ගමන් අන්දරේ සල්ලි ටිකක් වට්ටියට දමලා ආප්ප අරන් ගෙදර යන්න දිව්වා.

ආප්ප අම්මා ආප්ප වට්ටිය දිහා බැලුවා, පනම් පහේ කාසි හතරක් වෙනුවට එතන තිබුණේ පනමේ කාසි හතරක් විතරයි. ඇට හොඳට ම තරහ ගියා. "අන්දරේ ඔහොම නැවතියන්. මෙතන කාසි අඩුයි නේ. මොකද මේ පුංචි කාසි දමලා යන්නේ?" ඈ කේන්තියෙන් ඇහුවා.

"කාසි අඩු වුණා ම ආප්ප අම්මට ගණන් කරගන්නත් ලේසියි. කාසි පුංචි හින්දා තියා ගන්නත් ලේසියි," කියලා අන්දරේ පස්ස නොබලා ගෙදර දිව්වා.